**ඇල්කඩුව වැව්ලි සමාගමේ ගනුදෙනු පිළිබඳ වාර්තාව.   - 2024**
**------------------------------------------------------------------------**

ඇල්කඩුව වැව්ලි සමාගමේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන සමාගමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් විසින්ම එම අස්ථිත්‍ය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්යසාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

එම පනතේ 38(1) (ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශන අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීමට සිදුවන බව සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

## 2.1 වත්කම් හා වගකීම්වල පැවැත්ම

සමාගම විසින් අවසන් වරට පිළියෙළ කරන ලද 2022 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්, බැරකම්, ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| **අයිතමය** | **වටිනාකම** |
|---|---|
| **වත්කම්** | **රු.** |
| ජංගම නොවන වත්කම් | 1,700,148,750 |
| ජංගම වත්කම් | 286,562,970 |
| මුළු වත්කම් | 1,986,711,720 |

**බැරකම්**

| | |
|---|---|
| ජංගම නොවන බැරකම් | 189,783,327 |
| ජංගම බැරකම් | 834,464,205 |
| මුළු බැරකම් | 1,024,247,532 |
| ශුද්ධ වත්කම් / අයිතිය | 962,464,187 |
| මුළු ආදයම | 758,109,440 |
| මුළු වියදම | (427,159,794) |
| අතිරික්තය | 330,949,646 |

## 2.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති අංක පීඑඩී 01/2021 චක්‍රලේඛයට අනුකූලව නිකුත්කර ඇති රජය සතු ව්‍යවසායයන් දහා මෙහෙයුම් අත්පොතේ 6.6 ඡේදය ප්‍රකාරව මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් ගතවීමට පෙර මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කළ යුතු වුවද 2023 හා 2024 වර්ෂවල මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දිනවන විටත් විගණනයට ඉදිරිපත්කර නොතිබුණි. | කොවිඩ් 19 වසංගතය හමුවේ මුහුණ දීමට සිදුවූ නොවැළක්විය හැකි හේතූන් මත 2021, 2022 හා 2023 වර්ෂ වලට අදාළ අවසන් මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට විගණනය වෙත ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇත.නමුත් මේවන විටත් 2022 වසරේ විගණන කටයුතු අවසන් කර ඇති අතර එහි විගණන වාර්තාවද 2024 ට අදාළ ගනුදෙනු වාර්තාවද ලැබී ඇත. කෙසේ නමුත් 2025 දෙසැම්බර් 31 ට ප්‍රථම 2023 හා 2024 ගිණුම් වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට මේවන විටත් කටයුතු කරමින් පවතී. | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තා නියමිත දිනට විගණනය සඳහා ඉදිරිපත් කිරීමට විධිමත් වැඩපිළිවෙලක් සැකසිය යුතු අතර නියමිත දිනට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු නොකළ පාර්ශව වෙත පියවර ගත යුතුය. |

## 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1980 අංක 46 දරන සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල් පනතේ II කොටසේ 16 (1) වගන්තිය සහ 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 15 හා 16 වගන්ති | යොමුගත රෙගුලාසි ප්‍රකාරව වාරික මුදල් ගෙවීමට සමාගම විසින් කටයුතුකර නොතිබුණු බැවින් අධිභාර මුදල් ද සමග සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලට රු. 2,645,276 ක්ද, සේවක අර්ථසාධක අරමුදලට රු.236,781,312 ක්ද, වතු සේවකයින්ගේ අර්ථසාධක | එකගවේ.සමාගම ආරම්භයේ සිට පවතින ඌන මුදල් ප්‍රවාහය හේතුවෙන් සේවක ව්‍යවස්ථාපිත ගෙවීම් නිසි පරිදි සහ ක්‍රමානුකූලව නිරවුල් කිරීමට සමාගම අපොහොසත් වී ඇත. 2020 සිට මේ දක්වා | ව්‍යවස්ථාපිත විධිවිධාන පරිදි ගෙවිය යුතු දායක මුදල් නියමිත පරිදි නිරවුල් කිරීමට විධිමත් වැඩපිළිවෙලක් සකස් කරගත යුතු අතර විධිමත් |

| | | | | |
|---|---|---|---|---|
| | | අරමුදලට (ESPS) රු.12,338,852 ක් හා ලංකා වැවිලිකරුවන්ගේ අර්ථසාධක අරමුදලට (CPPS) රු.19,747,642 ක් ද වශයෙන් එකතුව රු.271,513,082 ක් 2024 වර්ෂය අවසානයට ගෙවිය යුතුව තිබුණි. | රු. මිලියන 370 කට අධික මුදලක් හිග ව්‍යවස්ථාපිත අරමුදල් නිරවුල් කිරීම වෙනුවෙන් සමාගමේ මුදලින් නඩු කටයුතු හරහා ගෙවා ඇත.ගෙවිය යුතු මුළු හිඟ මුල වන රු. මිලි. 530 ට ආසන්න මුදල රේඛිය අමාත්‍යාංශයේ හා මහා භාණ්ඩාගාරයේ මැදිහත්වීම මත 2026 වසරේදී ගෙවීමට කටයුතු කරමින් පවතින බව. | පරීක්ෂාවක් කර අධිභාර මුදල් ගෙවීම් සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශව වෙත පියවර ගත යුතුය. |
| (ආ) | 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ 02 වන කොටසේ 5(1) වගන්තිය | සේවකයකු විශ්‍රාම ගිය හෝ මරණයට පත් වු දින සිට දින 30 ක් ඇතුළත සේවකයාට හිමි පාරිතෝෂික ගෙවීම් කළ යුතු වුවත් සමාගම විසින් ඒ අනුව නියමිත දිනට පාරිතෝෂික නොගෙවීම හේතුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට අධිභාරද සමග රු. 290,751,806 ක් ගෙවිය යුතුව පැවතුණි. | එකඟ වේ. සමාගම ආරම්භයේ සිට පවතින ඌන මුදල් ප්‍රවාහය හේතුවෙන් සේවක ව්‍යවස්ථාපිත ගෙවීම් නිසි පරිදි සහ ක්‍රමානුකූලව නිරවුල් කිරීමට සමාගම අපොහොසත් වී ඇති බවත් රේඛිය අමාත්‍යාංශයේ හා මහා භාණ්ඩාගාරයේ මැදිහත්වීම මත 2026 වසරේදී ගෙවීමට කටයුතු කරමින් පවතින බව. | - එම - |
| (ඇ) | භාණ්ඩාගාර ලේකම්ගේ චක්‍රලේඛ | | | |
| (I) | 2016 ඔක්තෝබර් 27 දිනැති අංක PED 01/2015(i) දරන චක්‍රලේඛය | කළමනාකරු (මානව සම්පත්) හා අලෙවි කළමනාකරු තනතුර දරන නිලධාරීන්ට ප්‍රවාහන දීමනාවක් සහ ඉන්ධන වියදම් ලබා ගැනීමට හිමිකමක් නොමැති නමුත් ආයතනය විසින් ඔවුනට 2013 වර්ෂයේ සිට 2024 දෙසැම්බර් මාසය දක්වා කාලය තුල රු 7,151,613 ක ප්‍රවාහන දීමනාද, 2013 වර්ෂයේ සිට 2024 දෙසැම්බර් මාසය දක්වා රු. 3,185,015 ක ඉන්ධන වියදමක්ද ලෙස එකතුව රු.10,336,628 ක් ලබා දී තිබුණි. | ප්‍රවාහන පහසුකම් ආයතනයේ විධායක ශ්‍රේණියේ නිලධාරීන්ට අධ්‍යක්ෂ මණ්ඩල තීරණයකින් රාජකාරිමය අවශ්‍යතා මත ලබා දී ඇති නමුත් මෙම පහසුකම් තවදුරටත් ලබාදීම පිළිබඳ අවශ්‍ය උපදෙස් හා අනුමැතිය ඉල්ලා රේඛිය අමාත්‍යාංශය වෙත නිර්දේශ ඉදිරිපත් කර ඇති බව. | චක්‍රලේඛ ප්‍රකාරව දීමනා ගෙවීම් කළ යුතු අතර භාණ්ඩාගාරය හා රේඛිය අමාත්‍යාංශයේ නිර්දේශ මත කඩිනම් පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (II) | 2022 ජනවාරි 14 දිනැති අංක PED/01/2015 (ii) දරන චක්‍රලේඛය | සභාපතිවරයාට වෙන්කරන ලද වාහනයක් ලබා ගැනීමේ හිමිකම පැවතියදී , 2023 මැයි 29 දින සිට 2024 ඔක්තෝබර් මාසය දක්වා ආයතනයේ වාහන දෙකක් සභාපතිවරයාගේ භාවිතය සඳහා වෙන්කරවා ගෙන 2023 ජූනි මාසයේ සිට 2024 ජූනි මාසය දක්වා මෝටර් රථ අලුත්වැඩියා හා නඩත්තු කිරීම සඳහා රු.3,978,542ක වියදමක් දරා තිබුණි. ඊට අමතරව 2024 නොවැම්බර් 01 දින සිට 2025 මැයි මාසය දක්වා පත්වී සිටි සභාපතිවරයාටද වාහන දෙකක් භාවිතය සඳහා ලබා දී තිබුණි. | සමාගම වෙත අමාත්‍යාංශය විසින් ලබාදෙන ලද රථ සංචිතයෙන් සභාපතිවරයා වෙත කාර් රථය මේ වන විටත් වෙන්කොට ලබා දී ඇත. එම සංචිතයෙන් සංචිත රථයක් ලෙස වෙන් කර ඇති ජීප් රථය වතු නිරීක්ෂණ කටයුතු සහ අනෙකුත් හදිසි ප්‍රවාහන අවශ්‍යතා වෙනුවෙන් පොදුවේ භාවිතා කරනු ලබයි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු අවිධිමත් පරිහරණය සම්බන්ධයෙන් අදාළ පරිදි පියවර ගත යුතුය. |
| (III) | 2022 ජනවාරි 14 දිනැති අංක PED 01/2015(ii) දරන චක්‍රලේඛය | | | |
| (i) | | කළමණාකරු (තොරතුරු තාක්ෂණ) නිලධාරියාට වෙන්කළ වාහනයක් ලබා ගැනීමේ හිමිකමක් නොමැති වුවද එම නියමයන්ගෙන් බැහැරව 2023 මැයි මාසයේ සිට 2024 දෙසැම්බර් 31 දක්වා රු. 1,135,472 ඉන්ධන සඳහා වියදම් ප්‍රතිපූර්ණය කර තිබුණි. | - එම - | චක්‍රලේඛ ප්‍රකාරව දීමනා ගෙවීම් කළ යුතු අතර අවිධිමත් පරිදි ගෙවීම් කිරීම සම්බන්ධයෙන් විධිමත් පියවර ගත යුතුය. |
| (ii) | | අභ්‍යන්තර විගණකට වෙන් කරන ලද වාහනයක් ලබා ගැනීමට හිමිකම් නොතිබියදී, ඔහු ආයතනයේ සංචිත වාහනයක් පෞද්ගලිකව ප්‍රයෝජනයට ගෙන 2020 පෙබරවාරි මාසයේ සිට 2024 දෙසැම්බර් දක්වා රු.662,655 ක ඉන්ධන වියදම්ද සමාගමේ වාහනය අනතුරට පත් වූ බැවින් ඔහුගේ පෞද්ගලික වාහනය සඳහා 2022 අගෝස්තු සිට 2024 දෙසැම්බර් දක්වා රු.1,215,918 ක ඉන්ධන වියදම් ද ඇතුලත්ව එකතුව රු.1,878,573 ක මුදලක් ඉන්ධන වියදම් ලෙස ප්‍රතිපූර්ණය කරගෙන තිබුණි. | - එම - | - එම - |

| | | | | |
|---|---|---|---|---|
| (iii) | | සහකාර ගණකාධිකාරී (මුල්‍ය නිළධාරි) තනතුරට හිමි නොවන රු.15,000 ක ගමන් වියදම් දීමනාවක් හා ලීටර් 100 ක ඉන්ධන වියදම් දීමනාවක් චක්‍රලේඛ නියමයන්ගෙන් බැහැරව අනුමත කර 2023 ජනවාරි සිට 2024 දෙසැම්බර් මස දක්වා රු.841,800 ක දීමනා ගෙවීම් කර තිබුණි. | මුල්‍ය නිළධාරි (Finance Officer ) තනතුර වෙත මෙතෙක් ගෙවා ඇති ගමන් වියදම් සහ ඉන්ධන දීමනාව වර්තමාන අධ්‍යක්ෂක මණ්ඩල තීරණයක් මත 2025 ඔක්තෝබර් මස සිට නතර කර ඇති බව. | - එම - |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (I) | මුදල් රෙගුලාසි 137 | සේවාවන්,වැඩ හෝ සැපයුම් සම්පූර්ණ කෙරුණු විට ඒ පිළිබඳ හිමිකම් භාරගැනීමට බලය දෙනු ලැබ ඇති අනුමත කිරීමේ නිලධාරියා විසින් අනුමත කිරිම කළ යුතු වුවද රු.1,109,827 වටිනා ගෙවීම් වවුචර් 08 ක් අනුමතකර නොතිබියදී ගෙවීම් කර තිබුණි. | එකග වේ. මෙම අඩුපාඩු ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරනු ලබන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු අතර අනුමත නොකළ ගෙවීම් සිදුකළ නිලධාරින්ට පියවර ගත යුතුය. |
| (II) | මුදල් රෙගුලාසි 138 | වවුචර් සහතික කිරීමට බලයලත් නිළධාරියකු විසින් වවුචරය සහතික කළ යුතු වුවත් සමාගම විසින් 2024 අගෝස්තු 16 දින රු.1,500,000 වටිනාකමැති වවුචරයක් සහතික කිරීමකින් තොරව ගෙවීම් සිදුකර තිබුණි. | එකග වේ. මෙම අඩුපාඩු ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරනු ලබන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු අතර වවුචර් සහතික කිරීමෙන් තොරව ගෙවීම් කළ නිලධාරීන්ට පියවරගත යුතුය. |
| (III) | මුදල් රෙගුලාසි 387 | චෙක්පත් මගින් කරන සියලුම ගෙවීම් සඳහා තම බැංකු ශේෂය ප්‍රමාණවත් දැයි ගෙවන නිලධාරියා විසින් නිතරම සොයා බැලිය යුතු අතර එසේම කිසිම ආණ්ඩුවේ බැංකු ගිණුමකින් අයිරා පහසුකම් ලබා ගැනීම තහනම් වුවද වැවිලි සමාගම 2024 දෙසැම්බර් 31 දිනට ලංකා බැංකු ගිණුමෙන් රු.37,086,565ක බැංකු අයිරා පහසුකම් ලබාගෙන තිබුණි. | මුල්‍ය දුෂ්කරතා හා හදිසි අවශ්‍යතාවයන් වලට මෙම ස්ථාවර අයිරා පහසුකම හරහා මුදල් ගෙවීම් සිදු කොට ඇති නමුත් වර්තමාන අධ්‍යක්ෂක මණ්ඩලයේ උපදෙස් මත මෙම ස්ථාවර බැංකු අයිරාව 2025 මැයි මස වන විට පියවා අවසන් කොට ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු අතර ඊට පටහැනිව කටයුතු කළ නිලධාරීන්ට විධිමත් පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (IV) | 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ සංශෝධනය කරන ලද මුදල් රෙගුලාසි 371(2)(ආ) වගන්තිය | සමාගම විසින් පවත්වා ගෙන යනු ලබන අත්තිකාරම් ලේඛනය 2025 මාර්තු මාසයෙන් පසු නඩත්තු කර නොතිබුණු අතර 2024 ජනවාරි සිට 2025 මාර්තු දක්වා පවත්වා ගෙන ගොස් තිබූ අත්තිකාරම් ලේඛනයද යාවත්කාලීනව නඩත්තු කර නොතිබුණි.තවද අත්තිකාරම් ලේඛනය මාණ්ඩලික නිලධාරියකුගේ අධීක්ෂණයට ලක්වීද නොතිබුණි. අත්තිකාරම් පියවීමේ වවුචර් ඉදිරිපත් නොවූ බැවින් පියවීමේ නිවැරදිතාවය පිළිබඳවද විගණනයේදී සෑහීමකට පත් විය නොහැකි විය. | එකගවේ. මේ වන විටත් එම ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු කොට ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර ලේඛන යාවත්කාලීන කළ යුතු බවත්, විගණනයට ඉදිරිපත් නොකළ අත්තිකාරම් පියවීමේ වවුචර් විගණනයට ඉදිරිපත් කිරීමටත් කටයුතු කළ යුතුය. |
| (V) | මුදල් රෙගුලාසි 454(i) හා මුදල් රෙගුලාසි 752 හා මුදල් රෙගුලාසි 754 | රෙගුලාසි ප්‍රකාරව බඩු ලේඛන පොතක් සෑම කාර්යාලයකම 44 වැනි පොදු ආකෘති පත්‍රයෙහි පවත්වාගෙන යා යුතු අතර ආණ්ඩුවේ දේපළ වල සහ ගබඩා බඩුවල සෑම ද්‍රව්‍යක්ම බාර ගැනීම හා නිකුත් කිරීම මෙම පොතෙහි සඳහන් කළ යුතු නමුත් ආයතනයේ බඩු ලේඛන පොත යාවත්කාලීනව පවත්වා නොතිබුණි. සෑම මුදල් වර්ෂයකම අවසානයේදී බඩු ලේඛන පොත තුලනය කළ යුතු වුවද මෙම වට්ටෝරු පොත තුලනය කර නොතිබුණි. | බඩු ලේඛන පොතක් (STOCK BOOK) මේ වන විටත් යාවත්කාලීන කොට පවත්වාගෙන යන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීමටත්, ලේඛන යාවත්කාලීනව පවත්වා ගෙන යාමටත් කටයුතු කළ යුතු අතර එසේ නොකළ නිලධාරීන්ට පියවර ගත යුතුය. |
| (VI) | මුදල් රෙගුලාසි 756 | සමාගමට අයත් අංශ 05 ක 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ කටයුතු විගණිත 2025 සැප්තැම්බර් 03 වන දින වන විටද අවසන් කර නොතිබුණි. | ආයතනයේ සියලුම අංශවල (කොළඹ කාර්යාලයේ හැර) භාණ්ඩ සමීක්ෂණ වාර්තා මේ වන විට සම්පූර්ණකොට ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කාලීනව කටයුතු කිරීමට වැඩපිළිවෙලක් සැකසිය යුතුය. |
| (ඉ) | 2015 ජුනි 17 දිනැති අංක PED/3/2015 දරන මුදල් අමාත්‍යාංශයේ ලේකම්ගේ චක්‍රලේඛය - 2.14 හා 2.5 ඡේද | අදාල ආයතනයේ සභාපති විසින් ප්‍රධාන විධායක නිලධාරි (CEO) තනතුරද දරන විට ඔහුට ලබාගත හැක්කේ එක තනතුරක දීමනාවක් පමණක් බවත්, එකම ආයතනයේ තම ස්ථිර තනතුරේ සිට වෙනත් තනතුරක වැඩ ආවරණය කරන විට අමතර | 2022 වසරේ සිට 2024 ඔක්තෝබර් මස දක්වා ප්‍රධාන විධායක නිලධාරී යන තනතුර වෙනුවෙන් මාසිකව ගෙවන ලද රු. 100,000 යේ දීමනාව නව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අහෝසිකොට | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු අතර අවිධිමත්ව සිදු කර ඇති ගෙවීම් සම්බන්ධයෙන් විධිමත් පියවර ගත යුතුය. |

| | |
|---|---|
| ගෙවීමක් කළ නොහැකි බව චක්‍රලේඛයේ සඳහන්ව ඇතත් සභාපතිවරයාට ප්‍රධාන විධායක නිලධාරි තනතුරෙහි වැඩ බැලීම වෙනුවෙන් 2022 ජනවාරි 01 දින සිට 2024 ඔක්තෝබර් මාසය සඳහා රු.3,400,000 ක දීමනාවක් ආයතනය විසින් ගෙවා තිබුණි. | ඇත.මෙසේ නිසි අනුමැතියකින් තොරව ලබා ගෙන ඇති මෙම දීමනා පිළිබඳව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත ද පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇති බව. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගමේ ඇස්තමේන්තු තේ අස්වැන්න 2023 වර්ෂයේදී කිලෝග්‍රෑම් 2,684,566 ක් වූ අතර සත්‍ය තේ අස්වැන්න එයින් සියයට 63 ක් එනම් කිලෝග්‍රෑම් 1,685,131 ක් විය. 2024 වර්ෂයේදී කිලෝග්‍රෑම් 2,499,800 ක් වූ ඇස්තමේන්තු තේ අස්වැන්නෙන් සත්‍ය තේ අස්වැන්න ලෙස කිලෝග්‍රෑම් 1,780,247 ක් එනම් සියයට 71 ක් පමණක් ලබාගෙන තිබුණි. ඒ අනුව 2023 හා 2024 වර්ෂයන්හි ඇස්තමේන්තුගත තේ අස්වැන්න කරා ළඟාවීමට සමාගමට නොහැකි වී තිබුණි. තවද, 2023 ට සාපේක්ෂව 2024 නිෂ්පාදනය ඇස්තමේන්තුවද කිලෝග්‍රෑම් 184,766 කින් අඩුකර සකසා තිබුණි. | 2020 වසරේ සිට 2024 මුල් භාගය වනතෙක් වෙළඳපොල පැවති උග්‍ර රසායනික පොහොර හිඟය හේතුවෙන් ඇස්තමේන්තුගත කළ පොහොර ක්ෂේත්‍ර ගත කිරීමට නොහැකි වීම, 2020 වසරේ සිට රසායනික වල් නාශක භාවිතා කිරීම තහනම් කිරීම මත ක්ෂේත්‍රයේ වල් මර්ධනය කර ගැනීම දැඩි සේ අපහසු වී මත මෙම ක්ෂේත්‍ර වල දළු නෙලීමට සේවකයන් මැලි වීම, පොහොර භාවිතය ප්‍රයෝගික නොවීම සහ වල් නෙලීම සඳහා කම්කරුවන් යෙදීම ද ආර්ථිකමය වශයෙන් ඵලදායි නොවූ බැවින් අපේක්ෂිත ඇස්තමේන්තුගත ඵලදාව ලබා ගැනීමට අපහසු වී ඇත. සමාගමේ දැනට පවතින තේ වගාවන් හී වයස් විශ්ලේෂණයට අනුව සමාගම සතුව පවතින ඵලදායිතාවයෙන් අඩු ඉතා පැරණි තේ වගාවේ ප්‍රතිශතය 90% ක් ඉක්මවන බැවින් මෙම සාධකය ද අපේක්ෂිත තේ අස්වැන්න ලබා ගැනීමට බාධාකාරී වී ඇත. දැනට පවතින 63% ක් පමණ වූ බීජ තේ වගාව ගලවා ඉවත් කොට නැවත ප්‍රතිසම්පාදනය කිරීම සඳහා සුදුසුම කාලය එළඹ ඇතත් සමාගමේ පවතින කාරක ප්‍රග්ධන හිඟය සහ ආයෝජන ප්‍රතිලාභ ලගා කර ගැනීමට වසර 06 කට වඩා අධික කාලයක් ගන්නා | තේ වගාවේ වයස් විශ්ලේෂණය අනුව ස්ථිරසාර වගාවක් පවත්වාගෙන යාමට වැඩපිළිවෙලක් සකසා තේ දලු අස්වැන්න ඉහළ නංවා ගැනීමට විධිමත් වැඩපිළිවෙලක් සකසා ක්‍රියාත්මක කළ යුතු අතර ඉලක්කගත අස්වැන්න වාර්ෂිකව අඩු කිරීම වෙනුවට ඉහළ නංවා ගැනීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | බැවින් සමාගම සතු සීමිත සම්පත් දීර්ග කාලින ප්‍රග්ධන ආයෝජන සඳහා වෙන් කර තැබීමට අපහසු වී ඇති බව. | |
| (ආ) | අමු තේ දලු කිලෝ එකක නිෂ්පාදන පිරිවැය 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේදී සියළුම වතුයායන්හි වැඩිවී තිබුණු අතර ඇල්කඩුව වතුයායේ එය රු. 42 කින් එනම් සියයට 27 කින් වැඩිවී තිබුණි. 2022 වර්ෂයට සාපේක්ෂව 2024 වර්ෂයේදී ද, තේ දලු කිලෝ එකක නිෂ්පාදන පිරිවැය සැලගම වතුයාය හැර අනෙකුත් සෑම වතුයායකම වැඩිවී තිබුණු අතර ඇල්කඩුව වතුයායේ එය රු. 81 කින් එනම් සියයට 41 කින් ඉහළ ගොස් තිබුණි. | පෙර වසර වලට සාපේක්ෂව 2024 වසරේ අපේක්ෂිත තේ එලදාව 30% කට වඩා වැඩි ප්‍රමාණයකින් අඩු වීම මත වතුයායන් වල ස්ථාවර පොදු කාර්ය පිරිවැය ඉහළ යාම මුළු නිෂ්පාදන පිරිවැය ඉහළයාමට ප්‍රධාන වශයෙන් බලපා ඇත. එසේම, 2024 අගෝස්තු මස සිට කම්කරු වැටුප රු.1350 දක්වා වැඩිවීමත් ඒ හා සම්බන්ද ව්‍යවස්ථාපිත ගෙවීම් වල සාපේක්ෂ වැඩිවීමත් සමාගමේ නිෂ්පාදන පිරිවැය වැඩිවීමට මූලිකව හේතු වී ඇති බව. | තේ වගාව නිසි ලෙස කළමනාකරණය කිරීම තුළින් තේ දලු අස්වැන්න වැඩි කිරීමට හා පිරිවැය අවම කර ගැනීමට වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඇ) | 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේදී සෑම වතුයායකම තේ කිලෝග්‍රෑම් එකක සාමාන්‍ය විකුණුම් මිල රු.16 ත් රු.29 ත් අතර ප්‍රමාණයකින් වැඩි වී තිබුණද, පිටකන්ද වතුයායේ හැර අනෙකුත් සෑම වතුයායකම නිෂ්පාදන පිරිවැය, සාමාන්‍ය විකුණුම් මිලට වඩා වැඩිවීම රු.2 ත් රු.24 ත් අතර පරාසයක පැවතුණි. 2024 වර්ෂයේ දී සැලගම වතුයාය හැර අනෙකුත් සියලුම වතුයායන්හි විකුණුම් මිලෙහි අඩුවීමක් දක්නට ලැබුණද, එම වතුයායන්හි නිෂ්පාදන පිරිවැය, සාමාන්‍ය විකුණුම් මිලට වඩා වැඩිවීම රු.28 ත් රු.111 ත් අතර පරාසයක පැවතුණි. | පෙර වසර වලට සාපේක්ෂව 2024 වසරේ අපේක්ෂිත තේ එලදාව 30% කට වඩා වැඩි ප්‍රමාණයකින් අඩු වීම මත වතුයායන් වල ස්ථාවර පොදු කාර්ය පිරිවැය ඉහළ යාම මුළු නිෂ්පාදන පිරිවැය ඉහළයාමට ප්‍රධාන වශයෙන් බලපා ඇත. එසේම, 2024 අගෝස්තු මස සිට කම්කරු වැටුප රුපියල් 1350.00 දක්වා වැඩිවීමත් ඒ හා සම්බන්ද ව්‍යවස්ථාපිත ගෙවීම් වල සාපේක්ෂ වැඩිවීමත් සමාගමේ නිෂ්පාදන පිරිවැය වැඩිවීමට මූලිකව හේතු වී ඇති බව. | විධිමත් කළමනාකරණයක් යටතේ ගුණාත්මකභාවය ඉහළ නංවාගෙන තේ දළු සඳහා හොඳ මිලක් පවත්වාගෙන යාමට විධිමත් වැඩ පිළිවෙලක් සැකසිය යුතුය. |
| (ඈ) | සමාගමේ 2023 හා 2024 වර්ෂයන්හි ඇස්තමේන්තුගත රබර් නිෂ්පාදනයට සාපේක්ෂව සත්‍ය රබර් නිෂ්පාදනය පිළිවෙලින් සියයට 26 කින් හා සියයට 16 කින් අඩු වී තිබුණි. 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේදී සමාගමේ සත්‍ය රබර් නිෂ්පාදනය කිලෝග්‍රෑම් 15,554 කින් එනම් සියයට 14 කින්ද 2022 වර්ෂයට සාපේක්ෂව 2024 වර්ෂයේදී කිලෝග්‍රෑම් 9,527 කින් එනම් සියයට 09 කින් අඩු වී තිබුණි. | සමාගමේ දැනට පවතින රබර් වගාවන් හී වයස් විශ්ලේෂණයට අනුව රබර් වගාවෙන් 73% ක් එලදායිතාවයක් නොමැති ජීවකාලය වසර 60 කට වඩා පැරණි බීජ රබර් වගාවන් අතර එලදායිතාවයක් සහිත බද්ධ රබර් වගා ප්‍රතිශතය 27% ක් වැනි අඩු අගයක් වී ඇත. හෙක්ටයාරයකට සම්මත රබර් කිරි එලදාව ළඟා කරන ගැනීමට නම්, ජීවකාලය වසර 60 කට වඩා පැරණි බීජ රබර් වගාවන් ගලවා ඉවත් කොට නැවත ප්‍රතිසම්පාදනය කිරීම අත්‍යාවශ්‍ය වන නමුත් සමාගමේ පවතින කාරක ප්‍රග්ධන හිගය සහ | රබර් වගාවේ වයස් විශ්ලේෂණය අනුව ස්ථිරසාර වගාවක් පවත්වාගෙනයාමේ වැඩපිළිවෙලක් සකසා එලදායීතාවයෙන් වැඩි නව රබර් වගාව හා බද්ධ රබර් වගාව වැනි ක්‍රම තුළින් රබර් නිෂ්පාදනය ඉහළ නංවා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ආයෝජන ප්‍රතිලාභ ලගා කර ගැනීමට වසර 08 කට වඩා අධික කාලයක් ගන්නා බැවින් සමාගම සතු සීමිත සම්පත් දීර්ග කාලින ප්‍රග්ධන ආයෝජන සඳහා වෙන් කර තැබීමට අපහසු වී ඇති බව. | |
| (ඉ) | සමාගමේ ක්‍රියාකාරී සැලැස්ම අනුව 2023 හා 2024 වර්ෂයන්හි පිළිවෙලින් හෙක්ටයාර් 47.58 බැගින් වාර්ෂිකව පොල් වගා කිරීමට සැලසුම් කර තිබුණද සමාගම 2023 වර්ෂයේ පොල් වගා කිරීමක් සිදුකර නොතිබුණු අතර 2024 වර්ෂයේ හෙක්ටයාර් 1 පමණක් පොල් වගාකර ඇති බව ප්‍රගති වාර්තාවේ දක්වා තිබුණි. සමාගමේ පොල් ගස්වල වයස් විශ්ලේෂණය අනුව පොල් ගස් වලින් සියයට 68 ක් පමණ වසර 40 ක් ඉක්මවූ අඩු පලදාවක් සහිත ගස් බව විගණනයේ දී නිරීක්ෂණය විය.<br>2023 වර්ෂයට සාපේක්ෂව 2024 වර්ෂයේ පොල් ගෙඩියක නිෂ්පාදන පිරිවැය පොල් වගා කරන වතුයායන් 02 ක සියයට 31 ත් සියයට 48 ත් අතර පරාසයකින් ඉහල ගොස් තිබුණි. 2023 වර්ෂයට සාපේක්ෂව 2024 වර්ෂයේදී පොල් ගෙඩියක සාමාන්‍ය විකුණුම් මිල ඉහල ගොස් තිබුණද හපුගස්පිටිය වතුයායෙහි 2024 වර්ෂයේ විකුණුම් මිලට සාපේක්ෂව එහි පිරිවැය සියයට 83 ක් විය. | සමාගමේ දැනට පවතින පොල් වගාවන් හී වයස් විශ්ලේෂණයට අනුව පොල් වගාවෙන් 70% ක් පමණ වසර 40 කට වඩා පැරණි පොල් වගාවන් වේ.ජීවකාලය වසර 40 කට වඩා පැරණි පොල් වගාවන් ගලවා ඉවත් කොට නැවත ප්‍රතිසම්පාදනය කිරීම අත්‍යාවශ්‍ය වන නමුත් සමාගමේ පවතින කාරක ප්‍රග්ධන හිගය සහ ආයෝජන ප්‍රතිලාභ ලගා කර ගැනීමට වසර 08 කට වඩා අධික කාලයක් ගන්නා බැවින් සමාගම සතු සීමිත සම්පත් දීර්ග කාලින ප්‍රාග්ධන ආයෝජන සඳහා යෙදවීමට අපහසු වී ඇත. තවද සමාගම සතු පොල් වතුයායන් වලට දශක දෙකකට අධික කාලයක් තිස්සේ අවශ්‍ය රසායනික පොහොර ලබා නොදීම හේතුවෙන් සියලුම ගස් වල වර්ධනය සහ එහි ඵලදාව ඉතා සීඝ්‍ර ලෙස පහල ගොස් ඇත. | පොල් ගස් වල වයස් විශ්ලේෂණයට අනුව ස්ථිරසාර වගාවක් පවත්වාගෙන යාමට විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමටත් පොල් ඵලදාව ඉහළ නංවා ගැනීමට හා නිෂ්පාදන පිරිවැය අවම කර ගැනීමට කටයුතු කිරීමත් කළ යුතුය. |
| (ඊ) | පොල් කර්මාන්තයේ පොල් වැටීමේ සම්මතය සියයට 05 ක් වුවත් ඇල්කඩුව වැවිලි සමාගමේ 2023 හා 2024 වර්ෂයන්හි වැටුණු පොල් ගෙඩි ගණන පිළිවෙලින් 386,700 හා 240,139 ක් වූ අතර වර්ෂ දෙකෙහි පිළිවෙලින් එය මුළු පොල් පලදාවෙන් සියයට 34 හා 28 ක් පමණ විය. ඒ අනුව මිල්ලවාන වතුයායේ 2015 සිට 2024 දක්වා වර්ෂ 10 ක වැටුණු පොල් ගෙඩි (Fallen Nuts) ප්‍රතිශතය සියයට 17 සිට සියයට 35 දක්වා ප්‍රතිශතයක් ගෙන තිබූ අතර සම්මත ප්‍රමාණය වූ සියයට 5 දක්වා වූ ප්‍රතිශතය සැලකිය යුතු මට්ටමින් ඉහල ගොස් තිබුණි. | පොල් ගස් වලින් ගස් 21,330 ක් එනම් 70% ක ප්‍රමාණයක් උස අඩි 40 කට වඩා වැඩි ගස් වන අතර එමගින්ද විශාල ප්‍රමාණයක් අඩි 60 ට වඩා වැඩි වේ. මෙම වතුයයේ පොල් කැඩීම කොන්ත්‍රාත් පදනම මත කෙකි මගින් සිදු කරන අතර කැඩිය හැකි උපරිම උස අඩි 60 කට සීමා වී ඇත. දැනට ක්ෂේත්‍රයේ ගස් නැගීම මගින් පොල් කඩනන්න්ගේ ඇති හිගකම සහ අධික උසකින් යුත් පොල් ගස් නැගීමට මැලිකමක් දැක්වීම නිසා පොල් වැටීමේ ප්‍රතිශතය දිගින් දිගටම ඉහල ගොස් ඇති බව. | පොල් කැඩීමේ කාර්යය නිසි ලෙස කළමනාකරණය කිරීම තුළින් වැටුණු පොල් ප්‍රතිශතය අවම කරගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නාලන්ද වතුයායේ 2024 වර්ෂයේ අමු කජු නිමැවුම කිලෝ ග්‍රෑම් 10,423 ක් පැවති අතර, ඉන් පළමුවර කිලෝ ග්‍රෑම් 5778 ක කජු තොගයක් එවකට සිටි වතු අධිකාරිවරයා විසින් රත්වත්ත වතුයායේ පිහිටි තේ කර්මාන්ත ශාලාව වෙත වියලීම සඳහා රැගෙන ගොස් තිබුණ ද රත්වත්ත තේ කර්මාන්ත ශාලාවෙන් භාණ්ඩ ලැබීම් තුන්ඩුවක් (GRN) ලබාගෙන නොතිබුණි. අදාළ කජු වියලීමෙන් වියලි කජු කිලෝ ග්‍රෑම් 3,928.2 ක් හෙවත් අමු කජු බරෙන් සියයට 68 ක වියළි කජු ප්‍රමාණයක් අලෙවි කර තිබුණි. 2024 වර්ෂයේ දෙවන කජු තොගයෙන් අමු කජු වියලීමෙන් සියයට 74 ක අවම වියලි කජු ප්‍රතිශතයක් ලැබී ඇති අතර, ඒ අනුව රත්වත්ත වතුයායේ තේ කර්මාන්තශාලාවට රැගෙන ගිය පළමු කජු තොගයෙන්ද අවම වශයෙන් සියයට 74 ක ප්‍රතිශතයක් පැවතිය හැකිව තිබුණ හෙයින් රු.128,664 ක පමණ අලාභයක් සමාගමට සිදු වී තිබුණි. | එකඟ වේ. සිදු වී ඇති රු.128,664 ක අලාභය පිළිබඳ හේතු දක්වන ලෙස අදාල වතු අධිකාරිවරයා වෙත දන්වා යවා ඇති බව. | විධිමත් පරීක්ෂණයක් පවත්වා වගකිව යුතු පාර්ශව වෙත පියවර ගැනීමටත් ඇස්තමේන්තුගත අලාභය අයකර ගැනීමටත් පියවර ගත යුතුය. |
| (ආ) | සමාගමේ ආයෝජනය කර ඇති ස්ථාවර තැන්පතු වර්ෂ 12 කාලයක් පුරාවට ජංගම ගිණුම්වල බැංකු අයිරාවක් වෙනුවෙන් ඇපයට තබා තිබුණු අතර බැංකු අයිරාව පියවීමට කටයුතු නොකිරීම නිසා වාර්ෂික ස්ථාවර තැන්පතු පොලී ආදායම ඉක්මවූ අයිරා පොලී වියදමක් දැරීම හේතුවෙන් 2012 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා වර්ෂ 12 ක කාලය තුළ සමාගමට රු.40,908,739 ක ශුද්ධ අලාභයක් ඇති වී තිබුණි. | එකඟ වේ. 2025 මැයි මස අදාල බැංකු අයිරාව සම්පූර්ණයෙන්ම පියවා ඇති අතර එමගින් 2025 සැප්තැම්බර් 30 න් අවසන් මුල් මාස 09 ය සඳහා රු.මි. 6.4 ක ශුද්ධ පොලී ආදායමක් ලබාගෙන ඇති බව. | විධිමත් මූල්‍ය කළමනාකරණයක් යටතේ ආදායම් උත්පාදනය වැඩිකර වියදම් අඩුකර ගැනීමෙන් බැංකු අයිරාව පියවීමට වැඩපිළිවෙලක් සැකසිය යුතුය. |
| (ඇ) | සමාගම සතුව පවතින ගොඩනැගිලි 2024 දෙසැම්බර් 31 දිනට තක්සේරු කර වත්කමේ නිවැරදි වටිනාකම හඳුනාගෙන නොතිබුණි. | එකඟ වේ. ඉදිරියේදී සමාගම සතු සියලුම වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට බලාපොරොත්තු වන බව. | නියමිත කාලය තුළදී වත්කම් තක්සේරු නිවැරදි වටිනාකම හඳුනාගත යුතුය. |
| (ඈ) | සමාගමට අයත් වතුයායන් දෙකක පවතින ගොඩනැගිලි 03 ක දැනට අනවසරයෙන් පුද්ගලයන් පදිංචි වී සිටියද, කළමනාකරණය විසින් මෙම අනවසර | එකඟ වේ. අනවසර පදිංචිකරුවන් සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග දැනටමත් ගෙන ඇති බව. | විධිමත් පරිදි කටයුතු කර අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමටත් වත්කම් ආරක්ෂා කිරීමට |

| | | | |
|---|---|---|---|
| | පදිංචිකරුවන් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | | වැඩපිළිවෙලක් යෙදීමටත් කටයුතු කළ යුතුය. |
| (ඉ) | සමාගමට අයත් වාහන 2025 සැප්තැම්බර් 01 දක්වා තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණු අතර, 2024 දෙසැම්බර් 31 දින වන විට ඇල්කඩුව වැවිලි සමාගම විසින් භාවිතා කරන නමුත් ඇල්කඩුව වැවිලි සමාගම වෙත පවරා නොගත් වාහන 25 ක් පැවතුණි. | එකඟ වේ. ආයතනය සතු සියලුම රථ වාහන ඉදිරියේදී ප්‍රත්‍යගණනය කිරීමට කටයුතු කරන්නෙමු. එමෙන්ම සමාගම වෙත පවරා නොගත් වාහන පවරා දෙන ලෙස එම රථ වාහන වල පරම අයිතිකරු වන ශ්‍රී ලංකා වැවිලි සංස්ථාව වෙත ලිඛිතව දන්වා යවා ඇති බව. | අයිතිය පවරා නොගත් වාහන අයිතිය පවරා ගැනීමටත් නියමිත කාලය තුළදී වාහන තක්සේරු කිරීමටත් කටයුතු කළ යුතුය. |
| (ඊ) | 2024 වර්ෂය තුළදී පවත්වා ගෙන ගොස් ඇති අත්තිකාරම් ලේඛනය අනුව අවස්ථා 12 කදී දෙන ලද රු.16,275,000ක් වටිනා අත්තිකාරම් දින 08 සිට දින 197 ක කාලයක් දක්වා පියවීමට ප්‍රමාද වී පැවතුණි. | එකඟ වේ. කෙසේ නමුත් වර්තමානයේ දී අත්තිකාරම් මුදල් නිදහස් කිරීමේදී ඊට ප්‍රථම ලබා ගෙන ඇති අත්තිකාරම් මුදල් පියවා අවසන් වන තෙක් කිසිදු අත්තිකාම් මුදලක් නිදහස් නොකිරීමටත් ලබා දුන් සියලුම අත්තිකාරම් මුදල් දින 14 ක කාලයක් ඇතුලත පියවා නිම කිරීමට ද අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු අතර අත්තිකාරම් පියවීම ප්‍රමාද කළ පාර්ශව වෙත පියවර ගත යුතුය. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගම සතුව කර්මාන්තශාලා 06ක් තිබෙන අතර සැලගම හා පන්සලතැන්න කර්මාන්තශාලා 2043 වර්ෂය දක්වා පුද්ගලික අංශයට බදු දී තිබුණි. ඇල්කඩුව හා පිටකන්ද කර්මාන්තශාලා 2 ක් පිළිවලින් 1987 හා 2002 වර්ෂයන්හි සිට ක්‍රියාත්මක තත්ත්වයේ නොපවතින අතර බණ්ඩාරපොළ කර්මාන්තශාලාවේ නිෂ්පාදන කටයුතු සමාගම විසින් සිදුකරමින් පවතී. රත්වත්ත තේ කර්මාන්ත ශාලාව 2008 වර්ෂයේදී වර්ෂ 30 කට බදු පදනමින් ලබාදී තිබුණද පළමු බදුකාලය අවසන්වීම හා එම කාලයට නියමිත පරිදි බදු මුදල් නොගෙවීම හේතුවෙන් 2019 වර්ෂයේදී | එකඟ වේ. කෙසේ නමුත් රත්වත්ත තේ කර්මාන්තශාලාව අදාල බදුකරු විසින් (A.P.N Plantations ) විශාල මුදලක් වැය කර නවීකරණය කර ඇති අතර මේ වනවිටත් එම කර්මාන්තශාලාව සමාගමට පවරාගෙන ඇති අතර මෙම රත්වත්ත කර්මාන්තශාලාව තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත මූලික ගෙවීම් ද සිදුකොට ඇති අතර තක්සේරු කටයුතු අවසන් වූ වහාම අදාල නීතිමය කටයුතු සිදු කිරීමට බලපොරොත්තුවන බව. | විධිමත් අධ්‍යනයක් හා වැඩපිළිවෙලක් යොදා අක්‍රීය මට්ටමේ කර්මාන්තශාලා උපයෝජනයට පියවර ගැනීමටත් හිග බදු මුදල් කඩිනමින් අයකිරීමට කටයුතු කළ යුතු බවත් හා මෙහෙයුම් කටයුතු විධිමත් කිරීමටත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගත යුතු බව. |

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | කර්මාන්තශාලාව නැවත සමාගම වෙත පවරාගෙන තිබුණද 2024 දෙසැම්බර් 31 දින වන විට බදුකරුගෙන් රු.5,630,494 ක මුදලක් සමාගමට අයවිය යුතුව තිබුණි. මෙම කර්මාන්තශාලාව දැනට නිෂ්කාර්ය තත්ත්වයේ පවතින අතර මෙහෙයුම් කටයුතු සිදු කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට සමාගම විසින් කටයුතු කර නොතිබුණි. | | |

### 3.4 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විධිමත් සැලැස්මක් හා අධීක්ෂණයක් යටතේ කාලීනව ගොඩනැගිලි නඩත්තු කිරීම හා අලුත්වැඩියා කිරීම් සිදු නොකිරීම හේතුවෙන් සමාගමට අයත් වතු යායවල් 05කට අදාලව පවතින ගොඩනැගිලි 20ක් සම්පූර්ණයෙන් ගරා වැටී සහ දැනට භාවිතා කළ නොහැකි මට්ටමට පත්ව ඇති අතර නිසි පරිදි නඩත්තු නොකිරීම නිසා රජයේ දේපළ විනාශ වීමට ඉඩහැර තිබුණි. | එකඟ වේ. දැනට සමාගමේ ප්‍රාග්ධන අරමුදල් සපයා ගැනීමේ දුෂ්කරතා හේතුවෙන් මෙම ගොඩනැගිලි පිළිසකර කිරීමට නොහැකි වී ඇති බවත් හඳුනාගත් ඉඩම් හා ගොඩනැගිලි රේඛීය අමාත්‍යාංශය හරහා සුදුසු බාහිර ආයෝජකයන් වෙත ලබා දීමට කටයුතු කර ඇති බව. | විධිමත් වැඩපිළිවෙලක් හා ප්‍රතිපත්තිමය තීරණ ගෙන රජයේ දේපල ආරක්ෂාකර ගැනීමට පියවර ගත යුතුය. |
| (ආ) | වතුයායවල් 06 කට අදාලව පවතින දැනට භාවිතයට ගන්නා සහ භාවිතා කළ නොහැකි ගොඩනැගිලි 53 ක් අලුත්වැඩියා මට්ටමේ පවතින අතර, ඒවා පිළිසකර කිරීම සඳහා කළමනාකරණය විසින් සුදුසු වැඩ පිළිවෙලක් මේ දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි. | එකඟ වේ. දැනට සමාගමේ ප්‍රාග්ධන අරමුදල් සපයා ගැනීමේ දුෂ්කරතා හේතුවෙන් මෙම ගොඩනැගිලි පිළිසකර කිරීමට නොහැකි වී ඇති අතර හඳුනාගත් ඉඩම් හා ගොඩනැගිලි රේඛීය අමාත්‍යාංශය හරහා සුදුසු බාහිර ආයෝජකයන් වෙත ලබා දීමට කටයුතු කර ඇති බව. | පිළිසකර කර භාවිතයට ගැනීම සඳහා සුදුසු ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඇ) | වර්ග 06 කට අයත් වාහන 29 ක් වර්ෂ 06 ත් 25 ත් අතර කාලයක් නිෂ්කාර්යව පවතින අතර, ඒවා අලුත්වැඩියා කර භාවිතයට ගැනීම හෝ අපහරණය කිරීමට කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි. | එකඟ වේ. මෙම භාවිතයට ගත නොහැකි වාහන සුදුසු පරිදි අපහරණය කිරීමට ඉදිරියේදී බලාපොරොත්තු වන බව. | විධිමත් පරිදි වත්කම් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | හපුගස්පිටිය වතුයායේ වතු අධිකාරිවරයාට ලබා දී තිබුණු ජීප් රථය කාර්මික දෝෂයක් සිදුවීම හේතුවෙන් | එකඟ වේ. කෙසේ නමුත් අදාල මෝටර් රථයේ කාර්මික දෝෂ අලුත්වැඩියාව අවසන් කොට ඇති | විධිමත් පරිදි වත්කම් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 2023 සැප්තැම්බර් 14 දින වේරගම ගරාජයකට අලුත්වැඩියාව සඳහා ගෙනගොස් තිබුණු අතර, 2024 දෙසැම්බර්31 දින දක්වා එය යථා තත්ත්වයට පත් කරගෙන නොතිබුණි. | අතර අදාල මුදල් ගෙවා එම වාහනය නිදහස් කර ගැනීමට බලාපොරොත්තු වන බව. | |
| (ඉ) | බණ්ඩාරපොළ වතුයාය විසින් භාවිතා කරන ලොරි රථය ධාවන තත්ත්වයේ නොමැති බැවින් 2024 අප්‍රේල් මාසයේ සිට අලුත්වැඩියාව සඳහා ගරාජයකට යවා තිබුණු අතර 2024 දෙසැම්බර් 31 දින වන විටද යථා තත්ත්වයට පත්නොකර මස 08 කට ආසන්න කාලයක් නිෂ්කාර්යව පැවතුණි. | එකඟ වේ. මෙම ලොරි රථය අලුත්වැඩියා කිරීම ආර්ථිකමය වශයෙන් ලාභදායිමය නොවන බැවින් එම රථය අපහරණ කිරීමට බලාපොරොත්තු වන බව. | -එම- |
| (ඊ) | ඇල්කඩුව වැවිලි සමාගම විසින් වාහන සඳහා ලොග් පොත් පවත්වාගෙන ගොස් නොතිබුණි. | එකඟ වේ. | ලොග් සටහන් පොත් නඩත්තු කළ යුතුය. |
| (උ) | සමාගමේ වාහන 16 ක වාහනවල භෞතික තත්ත්වය හා වර්තමානයේ පවතින ස්ථානයන් පිළිබඳ ලබා දුන් තොරතුරු අනුව එම වාහනවල වර්තමාන තත්ත්වය සම්බන්ධව තොරතුරු විගණනය වෙත ඉදිරිපත් නොවුණි. | එකඟ වේ. | විගණනය වෙත ඉල්ලූ තොරතුරු විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

**3.5 ආර්ථික නොවන ගනුදෙනු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බඳවා ගැනීමේ පටිපාටියෙන් බැහැරව හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව සමාගමේ වතු අධිකාරිවරුන් දෙදෙනෙකු වෙත "සමූහ කළමනාකරු" යන තනතුරක් 2024 ජූලි 26 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මඟින් ඇති කර, රු.50,000 ක දීමනාවක් ගෙවීමට අනුමත කර තිබූ අතර 2024 අගෝස්තු සිට 2024 දෙසැම්බර් 31 දක්වා මාස 05 ක් වෙනුවෙන් වතු අධිකාරිවරුන් දෙදෙනා සඳහා රු. 250,000 ක දීමනාවක් භාණ්ඩාගාර අනුමැතියකින් තොරව ගෙවා තිබුණි. | එකඟ වේ. කෙසේ නමුත් ආයතනයේ දැනට පුරප්පාඩුවී ඇති සාමාන්‍යාධිකාරී තනතුරේ, වතුයායන් වෙනුවෙන් පැවරී ඇති වගකීම් සියල්ල මෙම සමූහ කළමනාකරුවන් දෙදෙනා විසින් ඉටු කෙරෙමින් පවතින බවත් එමගින් සාමාන්‍යාධිකාරීවරයෙකු වෙනුවෙන් මාසිකව දැරිය යුතු රුපියල් ලක්ෂ 03 කට ආසන්න මුළු වියදමෙන් රුපියල් ලක්ෂ 2.5 ක පමණ මුදලක් ඉතිරි කර ගැනීමට සමාගමට හැකි වී ඇත. නමුත් මේ වන විටත් එක් සමූහ කළමණාකරුවෙකු එම තනතුරින් ඉල්ලා අස්වී ඇති බව. | විධිමත් පරීක්ෂණයක් සිදු කර භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමකින් තොරව තනතුරු ඇති කරවා ඊට අදාළ දීමනා ගෙවූ පාර්ශව වෙතින් ගෙවා ඇති දීමනාව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | විධායක බංගලා සඳහා අභ්‍යන්තර කම්කරුවන් දෙදෙනෙකුගේ සේවය ලබා ගත හැකි අතර බංගලාව හිමි නිලධාරියා අභ්‍යන්තර කම්කරුවන් සේවයේ යෙදවූයේ නම් එම කම්කරුවන්ගේ පැමිණීම ක්ෂේත්‍ර නිලධාරියා විසින් තහවුරු කර ගැනීමෙන් අනතුරුව ක්ෂේත්‍ර තුණ්ඩුවට හා චෙක්රෝලයට ඔවුන්ගේ නම ඇතුලත් කර, මාසිකව වතු කාර්යාලය මඟින් අදාල කම්කරුවන්ට වැටුප් ගෙවීම් කළ යුතුය. 2019 පෙබරවාරි 01 දින සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා සමාගමේ සේවය කරනු ලබන අලෙවි කළමනාකරු හට පදිංචිය සඳහා බංගලාවක් ලබා දී නොතිබුණද ඔහු විසින් අභ්‍යන්තර කම්කරුවන් දෙදෙනෙකු සේවයේ යෙදවූ බවට සඳහන් කරමින් ඉහත සඳහන් කාලපරිච්ඡේදය සඳහා රු.4,459,949 ක කම්කරු දීමනාවක් ලබාගෙන තිබුණි.<br>අභ්‍යන්තර කම්කරුවන් දෙදෙනෙකු සේවයේ යෙදවූ බවට ක්ෂේත්‍ර නිලධාරීන්ද තහවුරු නොකරන අතර, ඉහත කාලපරිච්ඡේදයේ කිසිදු දිනක උදෑසන පෙරට්ටුව සඳහාද කම්කරුවන් දෙදෙනා පැමිණ නොතිබියදී මෙම දීමනා ඔහු විසින් පෞද්ගලිකව ලබා ගෙන තිබුණු අතර සභාපතිවරයා විසින් ඉහත සඳහන් පුද්ගලයා ඇමතු 2019 ජනවාරි 10 දිනැති ලිපිය මඟින් පෞද්ගලික නිවසට හෝ එම මහතාට කම්කරු දීමනාවක් මුදලින් ලබාගත හැකි බව සඳහන් කර නොතිබුණි. තවද, සේවක අර්ථසාධක අරමුදල් දායකත්වයක් හා සේවක භාරකාර අරමුදල් දායකත්වයක් වෙනුවෙන් එකතුව රු.557,872 ක අයකරගත නොහැකි ව්‍යවස්ථාපිත ගෙවීමක් සේවකයන් දෙදෙනා වෙනුවෙන් සමාගමට දැරීමට සිදුව තිබුණි. | එකඟ වේ.අලෙවි කළමනාකරු හට පදිංචිය සඳහා බංගලාවක්ද ලබා නොදී තිබියදී හා අභ්‍යන්තර/ලියාපදිංචි කම්කරුවන් දෙදෙනෙකු එකී බංගලාවේ සේවයේ යෙදවූ බවට ක්ෂේත්‍ර නිලධාරිවරු තහවුරු කර නොතිබියදී හා නාලන්ද වතුයායේ පසු ගිය පෙරෙට්ටු 12 ක් පවත්වා තිබියදීත්, එම එකදු පෙරෙට්ටුවකට හෝ එකී කම්කරුවන් පැමිණ නොසිටියදී , අභ්‍යන්තර / ලියාපදිංචි කම්කරුවන් දෙදෙනෙකු සේවයේ යෙදවූ බවට ව්‍යාජ ලෙස සඳහන් කරමින් රු.4,459,949 ක කම්කරු දීමනාවක් ලබා ගැනීම සහ එකී කම්කරුවන් වෙනුවෙන් රු.557,872 ක මුදලක් ව්‍යවස්ථාපිත අරමුදල් වෙනුවෙන් ගෙවා අයකර ගත නොහැකි අලාභයක් කිරීම පිළිබඳව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත පැමිණිලි කර ඇති අතර දැනට එම නිලධාරියාගේ සේවය තාවකාලිකව අත්හිටුවා ඔහු වෙත චෝදනා පත්‍රයක් නිකුත් කොට ඇති බව. | විනය ක්‍රියාමාර්ග ගෙන වහාම අලාභය අයකර ගැනීමටත් ඉදිරියේ දී මෙවැනි තත්ත්වයන් වළක්වා ගැනීමට අභ්‍යන්තර වැඩපිළිවෙලක් යෙදීමත් කළ යුතුය. |
| (ඇ) | සමාගමේ 2020 සිට 2024 වර්ෂය දක්වා සේවය කළ සභාපතිවරයා හට රත්වත්ත වතුයායේ පංසල්තැන්න බංගලාව ලබාදී තිබුණු අතර, ඔහු විසින් ඔහුගේ කෑම සඳහා වන පරිභෝජන වියදම්ද ඇල්කඩුව වැවිලි සමාගමෙන් ප්‍රතිපූර්ණය කරගෙන තිබූ අතර ඒ අනුව ඉහත කාලපරිච්ඡේදයේ මාස 40 ක් සඳහා රු.2,202,293 ක දෛනික ආහාර වියදම් සභාපතිවරයා වෙනුවෙන් සමාගම දරා තිබුණි. | එකඟ වේ. අදාල කාල පරිච්ඡේදය තුල සේවය කල එම සභාපතිවරයාගේ පුද්ගලික පරිභෝජන වියදම වූ රු. 2,202,293/- පිළිබඳව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් යොමු කර ඇත. | විධිමත් පරිදි කටයුතු කර අලාභය අයකර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ඇල්කඩුව වැවිලි සමාගමේ විධායක නොවන තනතුරක් වන තොරතුරු තාක්ෂණ කළමනාකරු ලෙස සේවය කරනු ලබන නිලධාරියා හට රත්වත්ත වතුයායේ විධායක නිල නිවසක් ලබා දී තිබූ අතර එම විධායක බංගලාවේ කම්කරුවෙකු සේවයේ යෙදවීමට තොරතුරු තාක්ෂණ කළමණාකරුගේ ඉල්ලීම අනුව 2024 මැයි 09 දින අනුමැතිය ලබා දී තිබූ අතර, 2024 මැයි මස සිට 2024 දෙසැම්බර් මස දක්වා මාස 08 ක කාලයක් එවැනි කම්කරුවෙකු හෝ වෙනත් ආදේශක කම්කරුවෙකු බංගලාවේ අභ්‍යන්තරයේ සේවයේ යෙදවීමකින් තොරව තොරතුරු තාක්ෂණ කළමනාකරු විසින් රු.256,050 ක මුදලක් ලබාගෙන තිබුණි. | එකඟ වේ. තොරතුරු තාක්ෂණ කළමනාකරු ලෙස සේවය කරන නිලධාරියා කම්කරුවෙකු සේවයේ යෙදවීමකින් තොරව රු. 256,050/- ක මුදලක් ලබාගෙන තිබීම පිළිබඳ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් යොමු කර ඇති බව. | විනය ක්‍රියාමාර්ග ගෙන වහාම අලාභය අයකළ යුතු අතර මෙවැනි තත්ත්වයන් වලක්වා ගැනීමට අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ යුතුය. |
| (ඉ) | අභ්‍යන්තර විගණක විසින් ආයතනයේ නිල බංගලාවක් ඉල්ලා තිබුණු අතර, එම අවශ්‍යතාවය ඉටු කළ නොහැකි බැවින් භාණ්ඩාගාර අනුමැතියක්ද රහිතව 2023 ඔක්තෝබර් 04 දින පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව අභ්‍යන්තර විගණකට මාසිකව රු. 50,000 ක නිවාස කුලී දීමනාවක් ලබාදීමට අනුමත කර තිබුණු අතර ඒ අනුව 2023 නොවැම්බර් මාසයේ සිට 2024 දෙසැම්බර් මාසය දක්වා වලංගු නොවන නිත්‍යානුකූල බදුකුලී ගිවිසුමක් මත භාණ්ඩාගාර අනුමැතියක්ද රහිතව රු. 700,000ක් ගෙවා තිබුණි. | එකඟ වේ. අභ්‍යන්තර විගණක නිලධාරියා වෙත මාසිකව ගෙවා ඇති රු.50,000 ක නිවාස කුලී දීමනාව මේ වනවිටත් අවලංගු කොට ඇති බව. | විධිමත් පරිදි කටයුතු කර භාණ්ඩාගාර අනුමැතියකින් තොරව නිවාස දීමනාව ගෙවා තිබීමට අදාළ වගකිව යුතු පාර්ශව වෙතින් අදාළ ගෙවීම් අයකර ගැනීමට පියවර ගත යුතුය. |
| (ඊ) | 2011 මාර්තු 21 දින සහකාර ගණකාධිකාරී (මූල්‍ය නිලධාරී) තනතුරට පත් වූ නිලධාරිනියට 2022 දෙසැම්බර් 05 දින පැවැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී එළඹි තීරණයක් අනුව එම තනතුරේ MM-1-1 වැටුප් කාණ්ඩයේ පිහිටුවා තිබුණද බඳවා ගැනීමේ පටිපාටියට අනුව දැනට දරන තනතුර වන මූල්‍ය නිලධාරී තනතුර සඳහා JM-1-1 වැටුප් කාණ්ඩයේ පිහිටුවිය යුතු අතර, එම නිසා 2023 ජනවාරි සිට 2024 දෙසැම්බර් දක්වා රු. 986,690 ක වැටුප් වැඩිපුර ගෙවීමක් සිදු කර තිබුණි. | එකඟ වේ. බඳවා ගැනීමේ පටිපාටියට පරිබාහිරව වැරදි වැටුප් තලයක පිහිටුවා වැටුප් ගෙවීම මේ වන විටත් නිවැරදි කර ඇති බව. | බඳවා ගැනීමේ පටිපාටිය අනුව කටයුතු කළ යුතු අතර වැඩිපුර ගෙවූ වැටුප අදාළ පාර්ශව වෙතින් අයකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | බඳවාගැනීමේ පටිපාටියට අනුව, සභාපතිවරයාගේ ලේකම් තනතුර සඳහා ලබාදිය යුතු වැටුප් කාණ්ඩය JM-1-1 වියයුතු වුවත් එම තනතුර දරන නිලධාරිනිය සඳහා 2022 නොවැම්බර් 01 දින සිට MM-1-1 වැටුප් කාණ්ඩයේ පිහිටුවා වැටුප් ගෙවා තිබූ අතර ඒ අනුව 2022 නොවැම්බර් සිට 2024 දෙසැම්බර් දක්වා මෙම නිලධාරිනිය සඳහා රු.540,785 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. | එකඟ වේ. බඳවා ගැනීමේ පටිපාටියට පරිබාහිරව වැරදි වැටුප් තලයක පිහිටුවා වැටුප් ගෙවීම මේ වන විටත් නිවැරදි කර ඇති බව. | - එම - |
| (ඌ) | ඇල්කඩුව වැවිලි සමාගමේ මූල්‍ය කළමනාකරු ලෙස 2024 ජනවාරි 23 දින සිට කොන්ත්‍රාත් පදනම මත සේවය කරන නිලධාරියා හට කොන්ත්‍රාත් ගිවිසුමේ එකඟතාවයකට නොපැමිණ ආයතනය සතු මෝටර් රථය වෙන්කළ වාහනයක් ලෙස ලබා දී 2024 මාර්තු මස සිට 2024 දෙසැම්බර් මාසය දක්වා රු.882,448 ඉන්ධන වියදම් ප්‍රතිපූර්ණය කර තිබුණි. | එකඟ වේ. මෙම ප්‍රවාහන පහසුකම අධ්‍යක්ෂ මණ්ඩල තීරණයකින් රාජකාරිමය අවශ්‍යතා මත ලබා දී ඇති නමුත් මෙම පහසුකම් තවදුරටත් ලබාදීම පිළිබඳ අවශ්‍ය උපදෙස් හා අනුමැතිය ඉල්ලා රේඛීය අමාත්‍යාංශය වෙත නිර්දේශ ඉදිරිපත් කර ඇති බව. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු අතර ඊට පටහැනිව සිදු කර ඇති ගෙවීම් ඊට අදාළ පාර්ශව වෙතින් අයකළ යුතුය. |

## 3.6 ප්‍රසම්පාදනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.3 (අ) ඡේදය අනුව ඇල්කඩුව වැවිලි සමාගම සඳහා 2024 වර්ෂයට සැපයුම්කරුවන් ලියාපදිංචි කර නොතිබුණි. | එකඟ වේ. කෙසේ නමුත් 2025 වසරේ සිට සැපයුම්කරුවන් වාර්ෂික ලියාපදිංචි කිරීම ආරම්භ කොට ඇති බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාගම විසින් 2024 වර්ෂය තුළදී වාහන අලුත්වැඩියාවන් සහ අමතර කොටස් මිලදී ගැනීමේදී හැර අනෙකුත් ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීමේදී තාක්ෂණික ඇගයීම් කමිටු පත්කර නොතිබූ අතර රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6 ඡේදයේ සඳහන් තාක්ෂණික ඇගයීම් කමිටුවල වගකීම් හා කාර්යභාරය ප්‍රසම්පාදන කමිටුව විසින් සිදු කර තිබුණද, ප්‍රසම්පාදන කමිටු සඳහා ප්‍රසම්පාදනය කරනු ලබන අයිතමය පිළිබඳව විශේෂඥ දැනුමක් ඇති අයෙකු පත්කරීමකින් තොරව අවස්ථා 59 කදී එකතුව රු. 36,971,390 ක් වටිනා මිලදීගැනීම් තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශයකින් තොරව සිදුකර තිබුණි. තවද, මිල ගණන් කැඳවීම් සිදුකිරීමේදී විවෘත මිල කැඳවීම් සිදුකර ඇති බව ප්‍රසම්පාදන කමිටු වාර්තාවේ දක්වා තිබුණද, රජයේ මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 ඡේදයේ | එකගවේ. ඉදිරියේදී සුදුසු තාක්ෂණික දැනුමකින් යුත් අයවලුන් තාක්ෂණික ඇගයීම් කමිටු වෙත පත් කිරීමට හැකි සෑම අවස්ථාවකදීම කටයුතු කරනු ලබන බවත් රජයේ මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 හි පරිදි කටයුතු කරනු ලබන බව. | විධිමත් පරීක්ෂාවක් සිදු කර එක් අදාළ පාර්ශව වෙත පියවර ගැනීමටත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කිරීමට වැඩපිළිවෙලක් යෙදිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සඳහන් පරිදි සුදුසුකම්ලත් උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට ප්‍රසම්පාදනයට සහභාගිවීම සඳහා සමාන හා උපරිම අවස්ථා ලබාදිය යුතුය යන අරමුණට අනුව කටයුතු නොකර මෙම මිලදී ගැනීම් සිදුකර තිබුණි. | | |
| (ඇ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.7.5 වගන්තිය අනුව ප්‍රසම්පාදන කමිටුව සඳහා ආයතනයෙන් පරිබාහිර අමාත්‍යාංශයේ සහකාර ලේකම් මට්ටමේ නිලධාරියෙකු යොදාගතයුතු වුවද, 2024 වර්ෂයේදී සිදුකළ කිසිදු ප්‍රසම්පාදන කටයුත්තක් සඳහා ප්‍රසම්පාදන කමිටුවට ආයතනයෙන් බාහිර පුද්ගලයෙකු සහභාගි කරවාගෙන නොතිබුණි. | 2025 වර්ෂයේදී සමාගමේ ප්‍රසම්පාදන සුළු සහ ප්‍රධාන කමිටු වෙත සාමාජිකයන් අමාත්‍යාංශය වෙතින් පත් කර ඇත. ඒ අනුව ප්‍රසම්පාදන (සුළු) කමිටුව සඳහා ආයතනය තුලින් සාමාජිකයන් තිදෙනෙකු ද ප්‍රසම්පාදන (ප්‍රධාන) කමිටුව සඳහා ආයතනය තුලින් සාමාජිකයන් දෙදෙනෙකු ද අමාත්‍යාංශයේ අධ්‍යක්ෂක මට්ටමේ නිලධාරියෙකු ද පත්කොට ඇති බව. | - එම - |
| (ඈ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5 වන පරිච්ඡේදයේ සඳහන් පරිදි තාක්ෂණික පිරිවිතර භාණ්ඩ හෝ සේවා සඳහා ලංසු සූදානම් කිරීමට ලංසුකරුවෙකුට අවශ්‍ය වන සියලු තොරතුරු ඇතුලත් ලංසු කැඳවීමේ ලේඛන ප්‍රසම්පාදනයේදී යොදාගතයුතු බව දක්වා තිබුණද, එසේ ලංසු කැඳවීමේ ලේඛනයකින් හෝ ආයතනයට අවශ්‍යය පිරිවිතර වල සැලසුම් ආදිය ලංසුකරුවන් වෙත නොදන්වා මිල කැඳවීම් සිදු කර තිබුණි. | එකඟ වේ. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 05 පරිච්ඡේදය ප්‍රකාරව ඉදිරියේදී කටයුතු කරනු ලබන බව. | - එම - |
| (ඉ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1.(අ) ඡේදය අනුව කිසිම සාමාජිකයෙකු ප්‍රසම්පාදන කමිටුව සහ තාක්ෂණික ඇගයීම් කමිටුව යන දෙකේම සේවය නොකළ යුතු බව දක්වා ඇති නමුත් මෙම ආයතනයේ වාහන අලුත්වැඩියාවන් හා වාහන අමතර කොටස් මිලදී ගැනීම සඳහා පත්කරන ලද තාක්ෂණික ඇගයීම් කමිටුවල සහ ප්‍රසම්පාදන කමිටුවල එකම ප්‍රසම්පාදනයට අදාලව එකම සාමාජිකයින් පත්කරන ලද අවස්ථා 10 ක් පැවතුණි. | එකඟ වේ. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1.(අ) පරිච්ඡේදය ප්‍රකාරව ඉදිරියේදී කටයුතු කරනු ලබන බව. | - එම - |
| (ඊ) | ප්‍රසම්පාදන කැඳවීමේදී එම ප්‍රසම්පාදන කටයුත්ත ඉටුකරනු ලබන ආයතන වලින් ප්‍රසම්පාදන කැඳවීම වෙනුවට පුද්ගලයින්ගේ නමින් මිල ගණන් කැඳවා කර තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | - එම - |

| | | | |
|---|---|---|---|
| (උ) | ප්‍රසම්පාදන තීරණ වලට ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබාදී නොතිබියදී එක් නිලධාරියෙකුගේ එකගතාවය මත අවස්ථා 02 කදී රු.1,312,821 ක් වටිනා තීරණ ගෙන අවිධිමත් පරිදි ප්‍රසම්පාදනය කර තිබුණි. | ප්‍රසම්පාදන අනුමැතිය ලබා දීමේ අවස්ථාවේ දී ප්‍රසම්පාදන කමිටුවේ සාමාජිකයන් දෙදෙනෙකු දුරකථන මාර්ගයෙන් සම්බන්ධ වී අදාල අනුමැතිය වාචිකව ලබා දී ඇති අතර පසු අවස්ථාවකදී එම අනුමැතින් අත්සන්කොට ලබා දී ඇති බව. | - එම - |
| (ඌ) | වාහනයක් අලුත්වැඩියාවට අදාල ප්‍රසම්පාදන කමිටු තීරණය 2024 මාර්තු 29 දින ලබා දී තිබුණද, ඊට පෙර 2024 මාර්තු 28 දින රු.31,000 ක වවුචර්පත ගෙවීම් සඳහා ඉදිරිපත් කර තිබුණි. තවත් වාහනයක් අලුත්වැඩියා කටයුතු සිදු කිරීම සඳහා ප්‍රසම්පාදන තීරණය 2024 ජුලි 25 දින ලබා ගෙන තිබුණද, ඊට පෙර 2024 ජූලි 18 දින එම වාහනය අලුත්වැඩියා කිරීමට රු. 500,000 ක අත්තිකාරම් මුදලක් අලුත්වැඩියා සමාගමට ගෙවීම් කර තිබුණු හෙයින් ප්‍රසම්පාදනයේ අවිධිමත්භාවයක් නිරීක්ෂණය විය. | එකඟ වේ. | විධිමත් පරීක්ෂණයක් පවත්වා අවිධිමත් ප්‍රසම්පාදනයට අදාළ පාර්ශව වෙත පියවර ගැනීමත්, ප්‍රසම්පාදන කටයුතු විධිමත් කිරීමටත් පියවර ගත යුතුය. |

**3.7 වෙනත් කරුණු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සීමාසහිත ඇල්කඩුව වැවිලි සමාගමේ බඳවාගැනීමේ පටිපාටියේ 5.1 ඡේදය අනුව කළමනාකරු (මානව සම්පත්) තනතුර සඳහා බාහිරින් නිලධාරියෙකු බඳවා ගැනීමේදී ව්‍යාපාර, රාජ්‍ය පරිපාලන හෝ මානව සම්පත් කළමනාකරණය පිළිබඳ පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් සමඟ අවුරුදු 03 ක පරිපාලනය පිළිබඳ රජයේ හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක පළපුරුද්දක් සමඟ තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුමක් අවශ්‍යය බව දක්වා තිබුණද 2019 ජනවාරි 15 දින සිට 2021 නොවැම්බර් 30 දින දක්වා කොන්ත්‍රාත් පදනම මත එම තනතුරේ සහ කළමනාකරු (Outgrower) ලෙස සේවය කළ නිලධාරියාට 2021 දෙසැම්බර් 01 දින සිට කළමනාකරු (මානව සම්පත් ) ලෙස ස්ථිර පත්වීමක් ලබාදී මේ දක්වාම සේවය කරමින් සිටියද නිලධාරියාට බඳවා ගැනීම් පටිපාටියේ ඇතුළත් සුදුසුකම් නොතිබුණු බව නිරීක්ෂණය විය. | එකඟ වේ. මෙම කළමනාකරු (මානව සම්පත්) තනතුර දරන නිලධාරියා මාර්ගස්ථ ක්‍රමය ඔස්සේ උපාධි පාඨමාලාවක් හදාරන බවට දන්වා ඇති බව. | බඳවා ගැනීමේ පටිපාටිය අනුව කටයුතු කළ යුතු අතර අදාළ බඳවා ගැනීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් කර පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2021 දෙසැම්බර් 01 දින සිට කළමනාකරු (මානව සම්පත්) තනතුරෙහි ස්ථිර පත්වීමක් ලබා දී තිබූ නිලධාරියෙකු කළමනාකරු (Out-grower) තනතුරෙහි වැඩ බැලීම සඳහාද පත්කර රු. 10,000 ක වැඩබැලීමේ දීමනාවක් භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව ලබා දී තිබූ අතර එදින සිට 2024 ජනවාරි 12 දින දක්වා එම තනතුරෙහි වැඩ බැලූ කාලය තුල රු. 253,648 ක මුදලක් ගෙවා තිබුණි. | එකගවේ. දැනට මෙම දීමනාව අවලංගු කොට ඇති බව. | - එම - |
| (ඇ) | 2012 ජනවාරි 04 දින ඇල්කඩුව වැවිලි සමාගමේ දැනට ක්‍රියාත්මක බඳවාගැනීමේ පටිපාටියට අනුව කළමනාකරු (තොරතුරු තාක්ෂණ) ලෙස තනතුරක් අනුමත කාර්මණ්ඩල තනතුරුවල නොමැති වුවද 2005 ඔක්තෝබර් 03 දින සිට ගිණුම් සහයක ලෙස කටයුතු කර ඇති නිලධාරියාට 2014 අගෝස්තු 01 දින සිට කළමනාකරු (තොරතුරු තාක්ෂණ) තනතුරට උසස්වීමක් ලබා දී 2022 දෙසැම්බර් 12 දින සිට ඔහුගේ වැටුප IM-1-1 කාණ්ඩයේ පිහිටුවීම වෙනුවට MM-1-1 කාණ්ඩයේ පිහිටුවා 2022 දෙසැම්බර් 12 දින සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා එම නිලධාරියාට රු. 1,218,933 ක් වැටුප් වැඩිපුර ගෙවා තිබුණි. | එකඟ වේ. බඳවා ගැනීමේ පටිපාටියට පරිබාහිරව වැරදි වැටුප් තලයක පිහිටුවා වැටුප් ගෙවීම මේ වන විටත් නිවැරදි කර ඇති බව. | - එම - |
| (ඈ) | 2017 අගෝස්තු 01 දින සිට ඇල්කඩුව වැවිලි සමාගමේ අභ්‍යන්තර විගණක ලෙස පත්වීම ලබා ඇති නිලධාරියා හට පත්වීම් බලධාරියා විසින් විධිමත් පත්වීමක් ලබා දී නොමැති අතර එදින සිට විධිමත් පත්වීම් ලිපියක්ද නොමැතිව වසර 07 කට ආසන්න කාලයක් අභ්‍යන්තර විගණක ලෙස රාජකාරි ඉටු කරමින් පැවතුණි. | එකගවේ. මෙම පත්වීම පිළිබඳ වැඩිදුර උපදෙස් පතා නීතිපති දෙපාර්තමේන්තුව වෙත ලිපියක් යොමු කොට ඇති බව. | නීති උපදෙස් කඩිනමින් ලබාගෙන විධිමත් පරිදි ක්‍රියාමාර්ග ගෙන එහි ප්‍රගතිය විගණනයට වාර්තා කළ යුතුය. |
| (ඉ) | කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව විසින් අංක DMS/E3/34/8/220/1 හා 2011 අගෝස්තු 03 දිනැති ලිපිය අනුව සමාගමේ අනුමත කාර්ය මණ්ඩලය 35 ක් වන අතර 2024 දෙසැම්බර් 31 දිනට තත්‍ය කාර්ය මණ්ඩලය 27 කි. ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරක් වන මූල්‍ය කළමනාකාර තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත එක් අයෙක් සේවයේ යෙදෙන අතර තෘතීය මට්ටමේ තනතුරක් වන සහකාර වතු අධිකාරී තනතුර සඳහා එක් අයෙක් කොන්ත්‍රාත් පදනම මත | එකගවේ.නමුත් මෙම බඳවා ගැනීම් සම්බන්ධයෙන් අවසරය ඉල්ලා රේඛිය අමාත්‍යාංශය හරහා අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත ලිපි යොමු කොට ඇති බව. | කාර්ය මණ්ඩල විශ්ලේෂණයක් සිදු කර සමාගමේ අරමුණු හා පරමාර්ථ ලඟාකර ගැනීම සඳහා අත්‍යවශ්‍යම කාර්ය මණ්ඩල පුරප්පාඩු පමණක් පිරවීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සේවයේ යෙදෙන බව නිරීක්ෂණය වූ අතර ඒ අනුව විගණන දින වූ 2025 සැප්තැම්බර් 02 දින වනවිට ජ්‍යෝෂ්ඨ මට්ටමේ හා තෘතීය මට්ටමේ තනතුරු 04 ක් ද , ද්විතීය සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු 01 ක් ද පුරප්පාඩු වී පැවතුණි. | | |
| (ඊ) | අනුමත බඳවා ගැනීමේ පටිපාටිය අනුව සමාගමට ස්ථිර සාමාන්‍යාධිකාරීවරයෙකු 2012 වර්ෂයේ සිට පත්කර නොතිබුණු අතර කොන්ත්‍රාත් හා ආවරණ පදනම මත විගණිත වූ 2025 සැප්තැම්බර් 02 දින දක්වාත් සාමාන්‍යාධිකාරීවරු පත්කර තිබුණි. | එකඟ වේ. නමුත් සාමාන්‍යාධිකාරීවරයෙකු සමාගම වෙත බඳවා ගැනීම සම්බන්ධයෙන් කොළඹ අභියාචනාධිකරණයේ රිට් පෙත්සමක් විභාග වන බැවින් මෙම බඳවා ගැනීම දිගින් දිගටම ප්‍රමාද වෙමින් පවතින බව. | අධිකරණ කටයුතු කඩිනමින් නිමකරවා ගෙන ස්ථිර සාමාන්‍යාධිකාරීවරයෙකු පත්කර ගත යුතු බව. |
| (උ) | 2024 වර්ෂය සඳහා වතු කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික අයවැය මඟින් අනුමත කාර්ය මණ්ඩලය 89 ක් වුවද තත්‍ය කාර්ය මණ්ඩලය 63 ක් වූයෙන් 26 දෙනෙකුගේ පුරප්පාඩු පැවතුණි. | එකඟ වේ. දැනට පුරප්පාඩු වී ඇති වතු කාර්යමණ්ඩල තනතුරු සඳහා අදාල බඳවා ගැනීම් සමාගමේ අවශ්‍යතාවය මත සිදු කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලබන බව. | අවශ්‍යතාවය හඳුනාගෙන පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |
| (ඌ) | වැව්ලි සමාගමේ 2024 වර්ෂයේ ගෙවීම් කරන ලද රු.736,834 ක වටිනාකමක් සහිත ගෙවීම් වවුචර 08ක් අස්ථානගත වී තිබූ අතර වවුචර් පත් දෙකක් විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. | එකඟ වේ. අදාල ගෙවීම් වවුචර්පත් අස්ථාන ගතවී ඇති බැවින් ඒ පිළිබඳව වැඩි දුර සොයා බැලීම් සිදු කරමින් පවතින බව. | විධිමත් පරීක්ෂාවක් සිදු කර අදාළ වවුචර විගණනය වෙත ඉදිරිපත්කළ යුතු අතර වගකිව යුතු පාර්ශව වෙත පියවර ගත යුතුය. |
| (එ ) | 2020 ජූලි 10 දින සිට 2023 ඔක්තෝබර් 19 දක්වා ඇල්කඩුව වැව්ලි සමාගමේ සභාපති ධූරයේ සේවය කළ අය විසින් 2020 ජූලි මස සිට 2024 සැප්තැම්බර් මාසය දක්වා භාවිතා කරන ලද වාහන වලට ඉන්ධන වියදම් ලෙස රු.3,010,839 ක ප්‍රතිපූර්ණය කරගෙන තිබුණු නමුත්, එම වාහන වලට අදාල ධාවන සටහන් ඔහු විසින් නඩත්තු කර නොතිබුණි. | එකඟ වේ. අදාල කාල පරිච්ඡේදය තුල සේවය කල එම සභාපතිවරයාගේ ඉන්ධන වියදම වූ රු. 3,010,839/- වාහන ධාවන සටහන් නඩත්තු කිරීමකින් තොරව ප්‍රතිපූරණය කිරීම පිළිබඳව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් යොමු කර ඇති බව. | විධිමත් පරීක්ෂණයක් සිදු කර මෙම ක්‍රියාවලිය සඳහා වගකිව යුතු පාර්ශව වෙත විධිමත් පියවර ගත යුතුය. |